# පාසල් තුළ සූර්යසිංහ ළමා සමාජ පිහිටුවීම සඳහා මව්බිම ලංකා පදනම සහ අධ්‍යාපන අමාත්‍යංශය අතර අවබෝධතා ගිවිසුම

## 1 පූර්විකාව

පසුගිය වසර 30කට අධික කාලයක් තිස්සේ ශ්‍රී ලංකිකයින් වු අපි  ආනයනය කරනු ලබන දේ දේශියව නිපදවන දේට වඩා උසස් ලෙස සලකන, පාරිභෝජන සංස්කෘතියකට හුරුවී සිටියෙමු. එම තත්වයට සමගාමීව විවිධ රජයන් විසින් දේශිය නිෂ්පාදකයා දිරිමත් කරනු වෙනුවට ආනයනකරුවන්ට සහන ලබාදෙන ප්‍රතිපත්තිවලට මුල්තැන දිම නිසා දේශීය කර්මාන්තකරුවා අධෛර්යට පත්වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය නිෂ්පාදන සඳහා වන වෙළඳපොල හැකිලීමක් සිදුවනවාට අමතරව දේශීය නිෂ්පාදන ක්‍රමවේද සහ පද්ධතිවල සංවර්ධනය බිඳ වැටී ඇත. මෙම තත්වය තුළ දේශීය ව්‍යාපාරිකයා, නිෂ්පාදනය පදනම් වූ ව්‍යාපාර සඳහා ආයෝජනය කිරිමට මැලිකමක් දක්වයි. එපමණක් නොවේ, පවත්වාගෙන යා නොහැකි කර්මාන්ත දෙවතාවක් නොසිතා වසා දැමීමට කර්මාන්තකරුවා පෙළඹී ඇත. මෙම අහිතකර තත්වයන් යටතේ සැබෑ ලෙසම ශ්‍රීලාංකීය භූමිය සමග ගැඹුරින් බැඳුණු ව්‍යාපාරිකයින් අතලොස්සක් පමණක් ඉතා දුෂ්කර තත්වයන් යටතේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරිම සඳහා තම දායකත්වය සපයති. ඔවුන් දිරිමත් කරමින් දිර්ඝ කාලිනව නිෂ්පාදන කාර්යයන් සඳහා යොමු කිරිම අද ජාතිය හමුවේ ඇති ප්‍රබල අභියෝගයකි.

අප රටට ආනයනය කරනු ලබන නිෂ්පාදන වලින් අති බහුතර ප්‍රමාණයක් මෙරට නිෂ්පාදනය කළ හැකි නිෂ්පාදන ලෙස හඳුනාගෙන ඇත. අප රටට අවශ්‍ය දේ නිපදවා ගැනීමට අප අසමත් වී ඇති බැවින් වර්ෂයකට රුපියල් බිලියන 400 ක් පමණ පිට රටවලට ඇදී යයි. එවැනි තත්වයක් යටතේ අපගේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ජාතියක් ලෙස අප බොහෝ දේ කළ යුතුව ඇත.

මෙම තත්වය තුළ අප රටේ ජාතික ආර්ථිකය ශක්තිමත්කොට තිරසාර සංවර්ධනයක් තුළින් දියුණු සමාජ ආර්ථික මට්ටමකට ගෙන ඒමට නම් අනිවාර්යයෙන්ම දේශිය කර්මාන්තකරුවා ශක්තිමත් කරන අතරතුර සැබෑ දේශීය නිෂ්පාදනවලට වෙළඳපොල තුළ ඉල්ලුම වැඩි කළ යුතුව ඇත. එවැනි ප්‍රවේශයක් සාර්ථක වීමට නම් රටේ මහජනයා හැඟීම්බරව සහ දැනුවත්ව එම සද්කාර්යට උරදිය යුතුය. ඒ සඳහා මහජනයා දැනුවත් කිරීම සහ පෙළඹවීම සඳහා මව්බිම ලංකා පදනම විසින් මහජන ක්‍රියාකාරකම් රැසක් යෝජනා කොට ඇත. එහිදී පවුල් ඒකකය තුළ දරුවන් විසින් ඇතිකරනු ලබන මානසික බලපෑම සැලකිල්ලට ගෙන පාසල් සිසුන් සම්බන්ධවන ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත. පාසල් සිසුන් අතර දියත් කරනු ලබන ක්‍රියාකාරකම් කාර්යක්ෂමව සහ ප්‍රතිඵලාදායක ලෙස ඉටුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ ආශිර්වාදය සහ සක්‍රීය සයයෝගය අත්‍යවශ්‍ය සාධකයක් බව ඉතා පැහැදිලිය. මව්බිම ලංකා පදනම සහ අධ්‍යාපන අමාත්‍යංශය අතර මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරනු ලබන්නේ, එම අවශ්‍යතාවයන් ඉටුකර ගැනිම සඳහාය.

## 2 අවබෝධතා ගිවිසුමට අදාල පාර්ශවයන් සහ බලාත්මකවීම

මව්බිම ලංකා පදනම පළමු පාර්ශවය ලෙසත් අධ්‍යාපන අමාත්‍යංශය දෙවන පාර්ශවය ලෙසත් සලකා අත්සන් කරනු ලබන අවබෝධතා ගිවිසුම මෙතැන් පටන් ගිවිසුම ලෙස සඳහන් වන අතර, එය බලාත්මක වන්නේ ඉහත පාර්ශව නියෝජනය කරමින් මව්බිම ලංකා පදනමේ සභාපතිවරයා සහ අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයාගේ බලයළත් නිලධාරියා විසින් පහත අත්සන් යෙදීමෙන් අනතුරුවය.

## 3 පළමු පාර්ශවය

මෙම ගිවිසුමේ පළමු පාර්ශවය වන අංක ඒ4, පෙරහැර මාවත, කොළඹ 03. යන ලිපිනයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන මව්බිම ලංකා පදනම ලාභ නොලබන සමාගමක් ලෙස 1987 අංක 17 සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇත. එහි අධ්‍යක්ෂක මණ්ඩලය පහත පරිදිවේ.

**සභාපති** ආරියශීල වික්‍රමනායක මහතා
(පැලවත්ත සීනි සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂක සහ මාස්ටර් ඩයිවර්ස් ආයතනයේ සභාපති)

**අධ්‍යක්ෂ-** කුලතුංග රාජපක්ෂ මහතා
(ඩී එස් අයි සමුහ ව්‍යපාරයේ කලමණාකාර අධ්‍යක්ෂක)

**අධ්‍යක්ෂ-** සමන් කුමාරසිංහ මහතා
(මල්ටිකෙම් සමුහ ව්‍යපාරයේ සභාපති)

**අධ්‍යක්ෂ-** රන්ජිත් පේජ් මහතා
(කාර්ගිල්ස් සමුහ ව්‍යපාරයේ කළමණාකාර අධ්‍යක්ෂක)

**අධ්‍යක්ෂ-** ආචාර්ය ත්‍රිශාන්ත නානායක්කාර මහතා
(නව නිපැයුම් කරුවන්ගේ කොමිසමේ හිටපු සභාපති සහ මොරටුව විශ්ව විIලය ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය)

**අධ්‍යක්ෂ-** මහාචාර්ය රන්ජිත් සේනාරත්න මහතා
(රුහුණු විශ්ව විද්‍යාලයේ හිටපු උපකුළපති)

**අධ්‍යක්ෂ-** මහේන්ද්‍ර අමරසුරිය මහතා
(කොමර්ෂල් බැංකුවේ සභාපති)

**අධ්‍යක්ෂ-** සේනාරත්න ද සිල්වා මහතා
(සමාජ ක්‍රියාකාරික)

**අධයක්ෂ-** වෛද්‍ය කේ එම් වසන්ත බණ්ඩාර මහතා
(ගුණාත්මකභාවය කළමණාකරණය පිළිබඳ උපදේශක)

**අධ්‍යක්ෂ-** වෛද්‍ය සුමිත් චන්ද්‍රසිරි වන්නිආරච්චි මහතා
(විශේෂඥ පශු වෛද්‍ය)

**ගරු සමාජිකයෙකු ලෙස -** ඩබ්ලිව් ගුරුගේ මහතා
(කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය නියෝජනය කරන එහි ලේකම් තුමා)

**ගරු සමාජිකයෙකු ලෙස -** විලී ගමගේ මහතා
(උපාය මර්ගික ව්‍යපාර කළමණාකරන ආයතනය නියෝජනය කරන එහි සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරිතුමා)

## 4 දෙවන පාර්ශවය

මෙම අවබෝධතා ගිවිසුමේ දෙවන පාර්ශවය ලෙස ඉසුරුපාය බත්තරමුල්ල ලිපිනයේ කාර්යාලය පිහිටුවා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ බලයළත් නිලධාරියෙකු අත්සන් තබනු ඇත.

## 5 හැදින්වීම

ගන්න අපේ දේ හෙවත් සූර්යසිංහ ව්‍යාපෘතියට අදාල අධ්‍යාපන ක්‍රියාකාරකම් දැනටමත් පන්සල් දහම් පාසල් සහ ගම් මට්ටමේ විවිධ සංවිධාන ආශ්‍රිතව ක්‍රියාත්මක වන අතර එහි මූලික අරමුණ ජනතාවගේ දැනුවත් සහභාගීත්වය මත ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ මව්බිම ලංකා පදනම විසින් වන අතර ඊට කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය සහ උපායමාර්ගික ව්‍යාපාර කළමණාකරන ආයතනයේ සහයෝගය ලබාදේ. මව්බිම ලංකා පදනම මූලික වශයෙන් සැබෑ ශ්‍රී ලාංකීය නිෂ්පාදන මහජනතාව අතර ප්‍රචලිත කිරීම මගින් සහ දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් කිරීම මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කැපවූ සංවිධානයකි.

මව්බිම ලංකා පදනම විසින් සැබෑ ශ්‍රී ලාංකීය නිෂ්පාදන වලට, ඒවා දේශීය නොවන නිෂ්පාදන වලින් වෙන්කොට හඳුනාගැනීම සඳහා සුවිශේෂවූ සහතික කිරීමේ ක්‍රමවේදයක් මගින් සූර්යසිංහ සහතිකයක් ලබාදේ. මෙම සූර්යසිංහ ලාංඡනය දේශීය නිෂ්පාදනවල මුද්‍රණය කරනු ලබන අතර එමගින් මහජනතාවට ඒවා පහසුවෙන් වෙන්කොට හඳුනාගැනීමට ඉඩකඩ සැලසේ.

සූර්යසිංහ ලාංඡනය මගින් සැබෑ ලෙසම ජාතික චින්තනය සහ අපේකම නියෝජනය කරනු ලබන අතර එමගින් දේශීය භාණ්ඩවලට හැඟීම්බර වටිනාකමක් එකතුවේ. දැනුවත්ව දීර්ඝ කාලයක් තිස්සේ දේශීය නිෂ්පාදන මිළදීගැනීම සඳහා මහජනයා පෙළඹවීම තුළ, පොදුවේ රට පිළිබඳව බැඳීමක් ඇතිවන අතර ජාතික ආර්ථිකයක් ගොඩනැගීම සඳහා අවශ්‍යය මනෝභාවයක් ඇතිවනු ඇතැයිද මව්බිම ලංකා පදනම විශ්වාසකරයි.

## 6 අරමුණු

සූර්යසිංහ ලාංඡනය සහ ඊට අදාල සංකල්පය ප්‍රචලිත කිරීම සඳහා මව්බිම ලංකා පදනම විසින් ජාතික මට්ටමේ ප්‍රචාරක ව්‍යාපාරයක් මෙන්ම බිම්මට්ටමේ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අතරින් පාසල් සිසුන් දැනුවත් කරීමේ සහ අභිප්‍රේරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට ප්‍රමුඛතාවක් හිමිවී ඇත. මෙම ක්‍රියාකාරකම් හරහා දරුවන්ගේ ජීවන ක්‍රමය විශේෂයෙන්ම ආහාර පුරුදු සහ ආකල්ප ධනාත්මකව සහ රටට වඩා වැඩදායක ලෙස සංවර්ධනය කරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ තුළ දේශීය නිෂ්පාදන පරිභෝජනය වැඩිකිරීමට අමතරව තිරිඟු පිටි වෙනුවට සහල් පිටි සහ කිරිපිටි වෙනුවට නැවුම් එළකිරි පාරිභෝජනය දිරිමත් කිරීම සඳහා

විශේෂ අවධානයක් යොමුකරනු ඇත. පළමු වටයේදී සූර්යසිංහ ව්‍යාපෘතිය ජාතික පාසල් සහ මධ්‍ය මහා විද්‍යාල වලින් ආරම්භ කිරීමට බලාපොරොත්තුවේ.

**පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන සූර්යසිංහ වැඩසටහනේ අරමුණු පහත සදහන් පරිදි වේ.**

I තමාගේ මව්බිම වන ශ්‍රී ලංකාව පිළිබදව දරුවන් තුළ ආදරය සහ අභිමානය වර්ධනය කිරීම.

II දේශීය නිෂ්පාදන පාරිභෝජනය කිරීම සඳහා පාසල් සිසුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් පෙළඹවීම.

III දේශිය ආහාර පරිභෝජනය, විශේෂයෙන්ම තිරිඟු පිටි වෙනුවට සහල් සහ සහල් ආශ්‍රිත නිශ්පාදන සහ කිරිපිටි වෙනුවට නැවුම් එළකිරි භාවිතය සඳහා දිරිගැන්වීම.

IV ජාතික චින්තනයක් සහිත අපේකම අගයන දරුවන් ඇගයීමට ලක්කිරීම සහ ඔවුන් ජාතියට මගපෙන්වන ආදර්ශ ආකෘති බවට පත්කිරීම

V ශ්‍රී ලංකාව ලෝකයේ කීතිමත් රටක් බවට පත්කිරීමට අවශ්‍ය දියුණු අනාගත මිනිසා බිහිකිරීම සඳහා සිසුවාගේ අධ්‍යාපන මට්ටම සහ ජීවන කුසලතා ඉහළ දැමීම සඳහා සිසුන් තුළින්ම ක්‍රියාකාරකම් මතුකර ගැනීම, ඒවා දිරිමත් කිරීම සහ ඒවාට සහයෝගය ලබාදීම.

**7 පළමු පාර්ශවයේ වගකීම**

I පළමු පාර්ශවය පාසල් තුළ ක්‍රියාත්මක කෙරෙන සූර්යසිංහ වැඩසටහනට අදාල ක්‍රියාකාරකම් සඳහා යෝජනා සහ සැලසුම් සකස්කොට දෙවන පාර්ශවයට ඉදිරිපත් කිරීමටත් දෙවන පාර්ශවය විසින් එකතු කරනු ලබන සංශෝධන අනුව ක්‍රියාකාරී සැලසුම් නැවත සකස්කොට දෙවන පාර්ශවයට ඉදිරිපත්කිරීමට එකඟවේ.

II පළමු පාර්ශවය ඉහත 1 වගන්තිය අනුව ඉදිරිපත් කෙරෙන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකයින් සහ අනෙකුත් ද්‍රව්‍යමය සහ මුල්‍යමය සම්පත් හැකි උපරිම අයුරින් ලබාදීමට එකඟවේ.

III පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය එක්ව එකඟවතාවයෙන් පත්කරනු ලබන කළමණාකරන කමිටුවක් මගින් සූර්යසිංහ වැඩසටහනට අදාල සියළු ක්‍රියාකාරකම් වලට මග පෙන්වීමට සහ කළමණාකරනය කිරීමට අවශ්‍ය දායකත්වය සහ මැදිහත්වීම සිදුකිරීමට පළමු පාර්ශවය එකඟ වේ.

IV පළමු පාර්ශවය සූර්යසිංහ වැඩසටහනට අදාළ සියළු ක්‍රියාකාරකම් සහ සම්පත් යෙදවීම විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට එකහ වන අතර ඊට අදාළ වාර්ථා ඔනෑම විටක දෙවන පාර්ශවයක ලබාදීමටද එකග වේ.

V මෙම අවබෝධතා ගිවිසුමට අදාළ අරමුණු ඉටුකරගැනීම සඳහා තුන්වන පාර්ශවයක සහය ලබාගන්නා අවස්ථාවක,
උදා - මාධ්‍ය හෝ වෙනත් ප්‍රචාරක ආයතන ඒ සඳහා පූර්ව අනුමැතිය දෙවන පාර්ශවයෙන් ලබාගත යුතු බවට පළමු පාර්ශවය එකඟවේ.

## 8 දෙවන පාර්ශවයේ වගකීම

I පළමු පාර්ශවයේ සහ දෙවන පාර්ශවයේ එකඟතාවයෙන් සකස්කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේදී, පළමු වටයේදී ආදර්ශයක් ලෙස ජාතික පාසල් සහ මධ්‍ය විද්‍යාල තුළ පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව එහි සාර්ථක අසාර්ථභාවය ඇගයීමට ලක්කොට ඉන් පසු එලඹෙන එකඟතාවන් මත වැඩසටහන පුළුල් ලෙස පළාත්බද පාසැල් තුළට ගෙනයාමට දෙවන පාර්ශවය එකඟවේ.

II පාසල් තුළ සූර්යසිංහ සමාජ පිහිටුවීමේ සිට, එම සමාජ හරහා දියත්කරනු ලබන සියළුම ක්‍රියාකාරකම් ආශ්‍රිතව පාසල් තුළ මගපෙන්වීම සහ සොයාබැලීම සඳහා පාසැල් තුළ එක් ගුරුවරයෙකු මෙන්ම, අධ්‍යාපන කලාපය තුළ එම සියළු කටයුතු සම්බන්ධීකරණය සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු පත්කිරීමටත්, ජාතික මට්ටමින් සමස්ත වැඩසටහන සම්බන්ධීකණය සඳහා අමාත්‍යාංශ ඉහළ නිළධාරියෙකු පත්කිරීමටත් දෙවන පාර්ශවය එකඟවේ.

III සූර්යසිංහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයේ අධීක්ෂණය යටතේ යොදනු ලබන ද්‍රව්‍යමය සහ මුල්‍යමය සම්පත් භාවිතය සඳහා පූර්ව මුල්‍යමය සැලසුම් සකස්කරීමට සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් පසුව අදාල සම්පත් යෙදවීම පිළබඳව ගිණුම් පළමු පාර්ශවය වෙත ලබාදීමට ද දෙවන පාර්ශවය එකගවේ.

IV සූර්යසිංහ සමාජ මගින් පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පාසලේ ප්‍රධාන විෂය සමගාමී වැඩ සැලසුම්වලට අනුගතවන ලෙස සහ ඒවා එකිනෙකින් පෝෂණය වන ලෙස සහ එකිනෙකට බද්ධවෙන ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික මෙන්ම පරිපාලන මැදිහත්වීම සිදුකිරීමට දෙවන පාර්ශවය එකඟවේ.

V සූර්යසිංහ වැඩසටහනට අදාල පාසල් තුළ සිදුකරන ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බැලීමට සහ ඒවා පිළිබඳව අදාල ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සමග සාකච්ඡා කිරීමට සහ ඒවාට උදව්කිරීම සඳහා අවශ්‍ය පරිසර සකස්කරීමට පළමු පාර්ශවය විසින් නම් කර බලය ලබාදෙනුලබන නියෝජිතයින්ට ඒ සඳහා අවසරදීමට දෙවන පාර්ශවය එකඟවේ.

**9 පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය විසින් එක්ව ඉටු කළ යුතු වගකීම්**

I සූර්යසිංහ වැඩසටහනට අදාල සියළු කටයුතු විනිවිදභාවයෙන් යුතුව ඉටුකිරීමට සහ අදාල සියළුම තොරතුරු පාර්ශව දෙක අතර නිදහස්ව හුවමාරුකර ගැනිමට දෙපාර්ශවයම එකගවේ.

II සූර්යසිංහ වැඩ සටහනට අදාලව මතුවන සියළුම ගැටළු නිරාකරණය කිරීම සඳහා පාර්ශව දෙකම සද්භාවයෙන් සහ සහයෝගයෙන් කටයුතු කිරීමට එකගවේ.

III එක් පාර්ශවයකට හෝ එකගවිය නොහැකි ගැටුළු සහිත යෝජනා හෝ ක්‍රියාකාරකම් මතු වුවහොත් ඒවා වැඩසටහනින් ඉවත් කිරීමට දෙපාර්ශවය එකගවේ.

IV සූර්යසිංහ වැඩසටහන පිළිබඳව තුන්වන පාර්ශවයකට තොරතුරු ලබාදීමේදී හෝ ප්‍රචාරක කටයුතු සඳහා සූර්යසිංහ සමාජවල තොරතුරු යෙදාගන්නා අවස්ථාවල දෙපාර්ශවයේම එකගතාවයෙන් කටයුතුකිරීමට දෙපාර්ශවයම එකගවේ.

V සූර්යසිංහ ළමා සමාජ ආශ්‍රිත ක්‍රියාකාරකම් දියත් කිරීමේදී පාසලේ සාමාන්‍ය අධ්‍යාපණ කටයුතු වලට බාධාවක් සිදු නොවන පරිදි සියළු ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට දෙපාර්ශවයම එකගවේ.

VI පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය එක්ව එකගතාවයෙන් යුතුව අදාල ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා කළමණාකරන කමිටුවක් පත්කිරීමට දෙපාර්ශවය එකගවේ.

VII ඇමුනුම 01 සහ ඇමුනුම 02 මගින් ඉදිරිපත්කොට ඇති උපදෙස් මාලාව ප්‍රායෝගික තත්වයන් මත, අවශ්‍ය සංශෝධනයන්ට යටත්ව මගපෙන්වීමේ ලේඛන ලෙස භාවිත කිරීමට දෙපාර්ශවය එකගවේ.

2009…………………… මස ………….. දින අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ගරු අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේම්ජයන්ත මැතිතුමා ඉදිරිපිටදී එකගතාවයෙන් යුතුව අත්සන් කරන ලදී.

**පළමු පාර්ශවය**

………………………………......
ආරියසීල වික්‍රමනායක
සභාපති - මව්බිම ලංකා පදනම

……………………………….....
කුළතුංග රාජපක්ෂ
අධ්‍යක්ෂක - මව්බිම ලංකා පදනම

**දෙවන පාර්ශවය**

…………………………….
ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

**සාක්ෂි**

1………………………………

2 ……………………………

ඇමුණුම 01

## 1 සූර්යසිංහ ළමා සමාජ පිහිටවීම සඳහා උපදෙස් මාලාව

1 සූර්යසිංහ ළමා සමාජයක් පාසල් තුළ පිහිටවීම සඳහා වන අධ්‍යාපන අමාත්‍යාංෂය මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයට අනුව අධ්‍යාපන කාලාප මට්ටමින් සූර්යසිංහ සම්බන්ධිකාරවරයෙකු පත්කරනු ලැබේ. එතුමා මගින් පාසලේ විදුහල්පතිතුමා හරහා අදාල කටයුත්ත අධීක්‍ෂණය සඳහා ගුරු මහත්මයෙකු හෝ මහත්මියක පත්කරනු ඇත.

2 යම් පාසලක සූර්යසිංහ සමාජයක් පිහිටුවිය යුත්තේ අදාල අධීක්ෂණ ගුරුවරයා හෝ ගුරුවරිය විසින් විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමියගේ අවසරය හෝ සහාභාගිත්වය සහිත රැස්වීමක් කැඳවීම මගිනි.

3 සූර්යසිංහ ළමා සමාජයකට ඕනෑම වයස් මට්ටමක සිසු සිසුවියන්ට සහභාගීවිය හැක. ප්‍රථම රැස්වීමේදී ව්‍යවස්ථාවට අනුව සියළුම නිලධාරීන් සිසු සිසුවියන් අතරින් පත්කරගත යුතු අතර, ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකධුරය පමණක් ගුරු මහත්මයෙකු හෝ මහතමියක විසින් දැරිය යුතුය.

4 සූර්යසිංහ ළමා සමාජයේ තේමාව "අපෙන් රටට" යන්නයි. ඒ අනුව සමාජයේ පොදු ආචාරධර්ම ගිවිසුම, පොදු සභාවකදි කියවා සමුහිකව එකගතාවය පලකරන සිසුන්ට සූර්යසිංහ පදවිය හිමිවේ. සැබෑ සූර්යසිංහයකු වීම සඳහා සිසු දරුවා / දැරිය එම ආචාර ධර්ම වලට අනුව තමා තුළ චරිනාකම් පද්ධතියක් වර්ධනය කරගතයුතුවේ.

5 සූර්ය සිංහයා ගුරුදෙගුරුන්ට සහ සහෝදර සිසු සිසුවියන්ට, පාසලට සහ පොදුවේ රට වැසියාට තමා සතු උතුම් දෙයක් පරිත්‍යාග කරීමට සුදානම් සිසුවෙකි. එම පරිත්‍යාගය දැණුම, ශ්‍රමය ආදරය ගෞරවය හෝ ඕනෑම ද්‍රව්‍යමය සම්පතක් විය හැකග සෑම ක්‍රියාකාරකමක් තුළම මෙම චරිනාකම් පිළිබිඹු විය යුතුය.

6 සූර්යසිංහ ව්‍යාපාරය අනාගතයේ දිනක බාලදක්ෂ ව්‍යාපාරයටත් වඩා ඉදිරියට ගොස් රටට වැඩදායි දියුණු මනසකින් යුත් දරුවෙකු නිර්මාණය කිරීම සඳහා වන ජාතික ව්‍යාපාරයක් බවට පත්විය යුතුය. සූර්යසිංහයා යනු ගුරු දෙගුරුන්ට ගරුකරන ගහට-කොළට, සතා-සිව්පාවාට ආදරය කරන පොදු දේපල සුරකින, රටට වැඩදායි පුරවැසියෙකුවීම සඳහා තම අධ්‍යාපන කටයුතු ඉතා ඉහළින් කිරීමට උත්සාහකරන, දේශිය දේ අගයන සහ උසස් අධ්‍යාත්මික ජීවිතයක් සහිත දරුවෙකි. සූර්යසිංහ සමාජය පාසල තුළ මෙන්ම ඉන් පිටතදී ක්‍රියාකාරකම් තේරිය යුත්තේ එවැනි චරිනාකම් ළමා මනස තුළ රෝපණය වන සහ වර්ධනය වන අකාරයටය.

## 2 සූර්යයසිංහ ආදර්ශ ක්‍රියාකරකම්

1 සූර්යසිංහ සුභසාධක අරමුදලක් ගොඩනැගිම.
මේ සඳහා දෙමාපියන්ගෙන් මුදල් එකතු නොකළ යුතු අතර පාසලේ යම් ස්ථානයක කැටයක් තැබීම මගින් සිසුන් තමන්ගේ යම් වියදමක් කපා හැරීමෙන් යම් මුදලක් පරිත්‍යාග කිරීමට පෙළඹවිය හැක. එම මුදල් භාවිතා විය යුත්තේ පාසල තුළ සිටින අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික උපකාර අවශ්‍ය වන සිසුන්හට පරිත්‍යාග කිරීම සඳහායග

2 සූර්යසිංහ සමාජ මගින් පාසල් තුළ පාරිසරික සංස්කෘතික සහ සුභසාධක ක්‍රියාකාරකම් සංවිධානය කිරීම. (ඒ සඳහා මව්බිම ලංකා පදනම මගින් සිසුන් දිරිගැන්වීම සඳහා අවශ්‍ය දැනුම, පුහුණුව සහ අදාල සම්පත් යම් ප්‍රමාණයක් ලබාදිම සිදු කළ යුතුය.) මෙම ව්‍යාපෘති සිසුන් විසින්ම යෝජනා කොට ඔවුන් විසින්ම ක්‍රියාත්මක කළ යුතුය. එමෙන්ම ඒ සඳහා අවශ්‍ය සම්පත් රැස්කිරීම සඳහාද යෝජනා සිසුන් විසින් ඉදිරිපත් කළ යුතුය.

3 මව්බිම ලංකා පදනම මගින් පාසල් තුළ සූර්යසිංහ සංකල්පය ප්‍රචලිත කිරීම සඳහා සාකච්ජා සම්මන්ත්‍රණ දේශන පැවැත්වීම කළ යුතුය.

4 දේශීය දේ අගය කිරීම සහ ඒ පිළිබඳව අභිමානයක් ඇති කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ කථිකල රචනා සහ චිත්‍ර තරඟ සූර්යසිංහ සමාජ මගින් පැවැත්වීම.

5 නව නිපැයුම් කිරීම සඳහා සිසුන් දිරිමත් කිරීමල නව නිපැයුම් කොමිසම සමග එක්ව එම කටයුතු සඳහා ප්‍රචාරයක් ලබාදීමල තරඟ පැවැත්වීම, ත්‍යාග  සහ සහතිකපත් ලබාදීම ආදී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

6 ජාතික මට්ටමින් මාධ්‍ය සම්බන්ධීකරණය කරමින් හොඳම පාසල්  කථිකයා සහ නිවේදකයා / ඉදිරිපත් කරන්නා සඳහා තරඟ සහ විවාද තරඟ පැවැත්වීම සහ තෑගි ලබාදීම කළ යුතුය.

7 පාසල් තුළ හොඳම සිසුවා / සිසුවිය තේරීම සහ ඔවුන් සමාජයට හඳුන්වාදීම.

8 පාසල් තුළ හොඳම නායකයා / නායිකාව තේරීමේ තරඟ පැවැත්වීම.

9 සූර්යසිංහ චර්යා ධර්ම පාසල් තුළ මෙන්ම නිවාස තුළ ද ඇගැයීමට ලක්වන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සන්නස් පත්‍රයක් ලබාදීමල ලාංඡන හා ත්‍යාග ලබාදිම. ඒ අනුව සූර්යසිංහ පදවිය ලබාගැනිම සඳහා පහත සඳහන් ජීවන චර්යාවන්ට එකඟවිය යුතුය.(සූර්යසිංහ පොදු අචාර ධර්ම ගිවිසුම් පත්‍රය අලංකාරවත්ව මුද්‍රණයකොට (සිසු දරුවාගේ පින්තූරයක්ද සහිතව) රාමු කර නිවස තුළ ප්‍රදර්ශනය කිරීම සඳහා ලබා දීමේ වැඩ පිළිවෙලක් මව්බිම ලංකා පදනමේ සහය සහිතව දියත් කිරීම.)

## සූර්යසිංහ චර්යා ධර්ම ගිවිසුම් පත්‍රය

I මම දීර්ඝ ඉතිහාසයක් සහිත ශ්‍රී ලාංකීය ශිෂ්ඨාචාරය පිළිබඳව අභිමානයක් සහිත උසස් මනසක් ඇත්තෙක් වෙමි.

II මම සැමවිටම දේශීයව නිපදවන සැබෑ ශ්‍රී ලාංකීය නිෂ්පාදන පරිභෝජනය කිරීමට උනන්දුවෙමි.

III මම ගහට-කොලට, සතා-සිව්පාවාට, මගේ රට වැසියන්ට මෙන්ම රටේ පොදු දේපළවලට බෙහෙවින් ආදරය කරමි.

IV මම සෑම විටම මාගේ ගුරු දෙගුරුන්ට සහ අනෙකුත් වැඩිහිටියන්ට ඉහළම ගෞරවය සහ ආදරය පුද කරමි.

V මම මාගේ උපන්බිමට හැකි ඉහළම සේවය කිරීම සඳහා මාගේ අධ්‍යාපන කටයුතු සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් හැකි උපරිම ආකාරයෙන් සිදුකරමිග

VI මම මගේ ආගමික විශ්වාසයන්ට අනුව මගේ අධ්‍යාත්මික ජීවිතය සකසා ගැනිම සඳහා සැම විටම දිරිමත්වෙමි.

9 සූර්යසිංහ සමාජවල කටයුතු මෙන්ම එම කටයුතු වලට මුල්වන දක්ෂ සිසුන් රටට හඳුන්වාදීම සඳහා ජනමාධ්‍ය හරහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

10 පාසලේ ප්‍රයෝජනවත් ශාක පැල කිරිම, තිබෙන ගහකොල රැකගැනීම සහ ඒවාට සාත්තු කිරිම, පාසල අලංකාර කිරීම ආදී ක්‍රියාකාරකම් වලට නායකත්වය දිය යුත්තේද සූර්යසිංහයන් විසිනිග එයට දෙමාපියන්ගේ සහයද ලබාගත යුතුය.

11 තම ගෙවතු වල, පාසල් වත්තේ සහ ඒ ආශ්‍රිත රජයේ ඉඩම්වල ආහාරයට ගතහැකි ශාක වර්ග පැළකිරිම, ගෙවතු වගා ආරම්භ කිරිම සඳහා බීජ ලබාදීමට සහ පැළ තවාන් පවත්වාගෙනයාමට සිසුන් මැදිහත් විමග (තිරසාර සංවර්ධනයක් සහිත ජාතික ආර්ථිකයක් ගොඩනැගීමට අවශ්‍ය මනෝභාවය සිසුන් තුළ ඇති කිරීම සඳහා පාරිසරික සාදක වලට මුල්තැන දෙමින් කෘෂිකාර්මික ව්‍යාපෘති පාසල් ආශ්‍රිතව සහ ගෙවතු වල දියත් කිරීමට සහය දීම මින් අදහස් කෙරේ.)

12 පාසල පිරිසිදු කිරීම ආදිය සඳහා ශ්‍රමදාන සංවිධානය කිරීම. ඒ සඳහා සෑම පාසලකටම පොදු සූර්යසිංහ දිනයක් නම් කළ හැකිය.

13 දේශීය ආහාර ප්‍රචලිත කිරීම සඳහා පාසල් තුළ සම්මන්ත්‍රණ ප්‍රදර්ශන සහ වැඩමුළු පැවැත්වීම සහ පාසල තුළ දේශීය ආහාර අලෙවිසැල් පවත්වාගෙන යාම සඳහා උදව්කිරීම.

14 මදුරු මර්ධන ව්‍යාපෘති, පැළ සිටුවීමේ ව්‍යාපෘති වැනි ප්‍රජා සත්කාරක ව්‍යාපෘති සංවිධානය කිරීම සහ ඒ සඳහා මහජන සහය ලබා ගැනීම.

15 කියවීමේ සමාජ සහ පොත් හුවමාරු කිරීමේ සමාජ පනගැන්වීම.

16 දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් ජාතික වීර දින සැමරුම් සහ ඒ ආශ්‍රිත ආගමික උත්සව පැවැත්වීම.

**මෙම ආදර්ශ ක්‍රියාකාරකම් මග පෙන්වීමක් ලෙස සලකා සිසුන් තුළ යහපත් මානසික බලපෑමක් ඇති කළ හැකි විවිධ ක්‍රියාකාරකම් නිර්මාණශීලීව හඳුන්වා දිය යුතුය. ඉහළින් සැලකිය යුතු කරුණ වන්නේ "ශ්‍රී ලංකාවට හැකිය" යන මතය සිසු මනස තුළ රෝපණය කිරීමයිග**

## ඇමුනුම 02 - ආදර්ශ ව්‍යවස්ථාව

**............................ දින .................................................................**

**විද්‍යාලයේදී පැවැත්වූ තම පළමුවන මහා සම්මේලනයේදී සම්මතකොට පනවන ලද ..........**

**............................................ විද්‍යාලයීය සූර්යසිංහ ළමා සමාජයේ ව්‍යවස්ථාව**

**01. ළමා සමාජයේ නම** - .................................................................. විද්‍යාලයීය සූර්යසිංහ ළමා සමාජය විය යුතුය.

**02. ලිපිනය** - ..........................................................................
...........................................................................................................

**03. සූර්යසිංහ ළමා සමාජය පිහිටුවීමේ අරමුණ**

මෙම ළමා සමාජය පිහිටුවනු ලබන්නේ ශ්‍රීමව්බිම ලංකා පදනම෴ නමැතිල සමාගම් පණත යටතේ ලියාපදිංචිකරඇති ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යංශය අතර අත්සන්කොට ඇති එකඟතා ගිවිසුම ප්‍රකාර ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සිසු පරපුරේ දැනුවත් සහයෝගය ලබාගැනීම සහ තම මව්බිමට ආදරය කරන දියුණු මානසික ශක්තියක් සහිත දරු දැරියන් පිරිසක් බිහිකිරීම සඳහා වන ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් සාර්ථක කරගැනීම සඳහාය. එම අවබෝධතා ගිවිසුමේ අරමුණු සියල්ල සූර්යසිංහ ළමා සමාජයේද අරමුණු වේ.

**05. සාමාජිකත්වය**

මෙම ළමා සමාජයේ සාමාජිකත්වය අදාල පාසලේ ඕනෑම දරුවෙකුට දැරියකට ලබාගත හැක.

**5.1 සාමාජිකත්වය ලබාගැනීම**

සාමාජිකත්වය ලබාගැනීම සඳහා සාමාජික ඉල්ලුම්පත්‍රයක් ළමා සමාජයේ ගුරු ලේකම්වරයා නමින් ඉදිරිපත් කළවිට එයට අනුශාසක මණ්ඩලයේ අනුමැතිය ලැබුනු පසු සාමාජිකත්වය හිමිවනු ඇත.

ළමා සමාජයේ සාමාජිකත්වය ලබාගන්නා වූ සෑම අයෙකුම පහත සඳහන් පොරොන්දුව ලබාදිය යුතුය.

එනම්,

මෙතැන් පටන් සූර්යසිංහ පෝතකයෙක් / සූර්යසිංහයෙක් වන මම සූර්යසිංහ ළමා සමාජයේ සහ මව් සංගමයේ පොදු ප්‍රතිපත්තිවලට හා පොදු වැඩපිළිවෙලට එකඟ වෙමි. එහි අරමුණු හා ඉලක්ක සපුරා ගැනිමට ක්‍රියා කරමි. සමාජයේ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරමි. යනුවෙනි.

**5.2 ඉල්ලා අස්වීම**

තම ඉල්ලා අස්වීම සභාවේ ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව දැන්වීමෙන් ඔහුගේ/ඇයගේ නම සාමාජික ලැයිස්තුවෙන් ඉවත් කෙරෙනු ඇත.

**5.3 සාමාජිකත්වය අහිමිවීම හෝ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම පහත සඳහන් පරිදි විය හැක.**

i. යම් සාමාජිකයෙකු පාසල් ශිෂ්‍යයෙකු ශිෂ්‍යාවක වීම අවසන් වූ වහාම මෙම ළමා සමාජයේ සාමාජිකත්වය නිරායාසයෙන් අහිමි වේ.

ii. උනුශාසක මණ්ඩලය විසින් විනය හේතු මත සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට ගන්නා ලද තිරණයකට අනුව සාමාජිකයෙකු හෝ සාමාජිකාවක සාමාජිකත්වයෙන් ඉවත් කල හැකිය.

**06 සභාවේ ව්‍යුහය**

6.1 ළමා සමාජ මහා සම්මේලනය

i' සාමාන්‍යයෙන් වසරකට වරක් මහා සම්මේලනය පවත්වනු ලැබිය යුතුය.

ii' මහා සම්මේලනයේ ගණ පූර්ණය පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකක් (1/3) විය යුතුය.

vii' මහා සම්මේලනයේදී පහත සඳහන් තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කර ගත යුතුය.

01. සභාපති
02. උප සභාපතිවරු දෙදෙනෙක්
03. ප්‍රධාන ලේකම්
04. උප ලේකම්වරු දෙදෙනෙක්
05. සංවිධායක
06. කාරක සභිකයින් අට දෙනෙක්
07. භාණ්ඩාගාරික (අනුශාසක මණ්ඩලයේ ගුරුවරයකු ජ්‍යේෂ්ඨ භාණ්ඩාගාරික තනතුරට පත්කරගත යුතුය)

යම් නිළයකින් අයෙක් ඉල්ලා අස් වු විට හෝ වෙනයම් කරුණක් නිසා නිලයක් පුරප්පාඩු වු විට අනුශාසක මණ්ඩලයේ අනුමැතිය ඇතිව විධායක සභාව තුළින්ම අයෙකු තෝරා අදාල පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. තවද එකී පත්කිරීම් ඊළඟ මහා සම්මේලනය වන තෙක් වලංගු වේ.

07. **මුදල් පරිහරණය**

සභාවේ සියළුම මුදල් පාලනය කිරීමේ වගකීම ජ්‍යේෂ්ඨ භාණ්ඩාගාරික වරයාට පැවරේ. ඔහුගේ ඇයගේ උපදෙස්මත භාණ්ඩාගාරික වරයා කටයුතු කළ යුතුය.

08. **විනය**

ළමා සමාජයේ සමගිය රැක ගැනීමටත්. ශක්තිමත් කිරීමටත්, එහි ජයග්‍රහණයන් හැකියාවන් හා ගරුත්වය රැක ගැනීමටත්, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමටත් විනය අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. ළමා සමාජයේ හා මව් සංගමයේ ප්‍රතිපත්ති, වැඩ පිළිවෙල හා ඉලක්කයන්ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත්ව කරන පිළිගැනීම විනය වේ.

09. **ව්‍යවස්ථා සංශෝධනය**

i. ව්‍යවස්ථාව වෙනස් කිරීම හා සංශෝධනය කිරීමේ බලය ඇත්තේ, මහා සම්මේලනයට පමණි.

ii ව්‍යවස්ථාව සම්බන්ධ අර්ථ නිරූපණය කිරීමේ බලය හා නිභක්‍ෂ තැන්හිදී සුදුසු තීරණ ගෙන කටයුතු කිරීමේදී මව් සංගමය විමසා කටයුතුකිරීමේ පූර්ණ බලය අනුශාසක මණ්ඩලය සතුය.

10) **අනුශාසක මණ්ඩලය**

ගුරු මහත්මමහත්මීන් සහ විදුහල්පතිතුමා හෝ නියෝජ්‍ය විදුහල්පතිතුමා ඇතුලත් 5 දෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් පත්කරගත යුතුය. මොවුන් අතරින් එක් අයෙකු ජ්‍යේෂ්ඨ භාණ්ඩාගාරික වරයා ලෙස පත්කරගත යුතු අතර ජ්‍යේෂ්ඨ භාණ්ඩාගාරික අනුශාෂක මණ්ඩලයේ කැඳවුම්කරු ලෙස කටයුතු කළ යුතුය. අනුශාසක මණ්ඩලයේ වගකීම වන්නේ සූර්යසිංහ ළමා සමාජයේ සිසු නිළධාරි මණ්ඩලයට මග පෙන්වීම, පුහුණුව, උපදෙස් ලබාදීමයි.

11) සමාජික ඉල්ලුම්පත්‍ර ආකෘතිය

සූර්යසිංහ ළමා සමාජය ........................................................................................ විද්‍යාලය.

නම ..........................................................................................................................

උපන්දිනය ......................./........./........./

ස්ත්‍රී / පුරුෂ භාවය ..........................................

පන්තිය ....................................................

විශේෂ හැකියාවන් සහ දක්ෂකම්

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
…………………………………………………………………………………………….

නිවසේ ලිපිනය

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
…………………………………………………………………………………………….

මම සූර්යසිංහ ළමා සමාජයේ සාමාජිකයෙකු ලෙෂ කටයුතු කරමින් එම සමාජයේ අරමුණු ඉටු කරගැනීම සඳහා හැකි උපරිම දායකත්වය ලබාදෙමි.

අත්සන ................................................

දිනය ..................................................